THE INSTITUTE OF CHARTERED ACCOUNTANTS OF SRI LANKA

# SUGGESTED SOLUTIONS

03104 - කළමනාකරණය සහ ව්‍යාපාර ආර්ථික විද්‍යාව
ගිණුම්කරණ සහ ව්‍යාපාර සහතික පත්‍ර විභාගය - I
2012 සැප්තැම්බර්

NOT FOR SALE

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය

හිමිකම් ඇවිරිණි.

"A" කොටස

| | | | |
|---|---|---|---|
| 1. | 2 | 11. | 2 |
| 2. | 2 | 12. | 3 |
| 3. | 1 | 13. | 4 |
| 4. | 3 | 14. | 3 |
| 5. | 2 | 15. | 1 |
| 6. | 4 | 16. | 4 |
| 7. | 2 | 17. | 1 |
| 8. | 2 | 18. | 2 |
| 9. | 3 | 19. | 4 |
| 10. | 1 | 20. | 1 |

NOT FOR SALE

"B" කොටස

I කොටස

<u>පිළිතුරු අංක 01</u>

(අ) (I) ලෝකයේ පවත්නා විවිධ ආර්ථික ක්‍රමයන් වනුයේ,

(i) නිදහස් ව්‍යවසාය හෝ වෙළඳපොල ආර්ථික ක්‍රමයන් ; ධනවාදී ආර්ථික ක්‍රම

(ii) මධ්‍යගතව සැලසුම්කල හෝ මධ්‍යගතව මෙහෙය වන ආර්ථික ක්‍රමයන්; සමාජවාදී ආර්ථික ක්‍රමයන්

(iii) මිශ්‍ර ආර්ථික ක්‍රමයන්.

(II) ඉහත සඳහන් i , ii සහ iii අනුපිළිවෙලින් වෙන් වශයෙන් ගනිමින්, එවන් වර්ගීකරණයක් සඳහා වන පදනම පැහැදිලි කිරීම.

(i) සැපයුම සහ මිලගණන්, වෙළඳපොල බලවේග / මිල යාන්ත්‍රනය මගින් හසුරුවනු ලැබේ. නිපදවිය යුත්තේ කුමන භාණ්ඩයක්ද, එය නිපදවිය යුත්තේ කෙසේද, කවුරුන් සඳහාද, ඒවායේ මිලගණන් කොපමණ විය යුතුද යනාදී වශයෙන් වන කරුණු සම්බන්ධයෙන් වන මග පෙන්වීම කරනු ලබන්නේ වෙළඳපොල බලවේග වල අන්තර් ක්‍රියාකාරීත්වයෙන් / මිල යාන්ත්‍රනය මගිනි. රජයේ මැදිහත්වීම හෝ මධ්‍යගතව සිදුකෙරෙන සැලසුම්කරණය මෙහිදී පවත්නේ අවම මට්ටමකිනි. නැතහොත් එවැන්නක් කොහෙත්ම දක්නට නොමැත.

(ii) සැපයුම සහ මිලගණන්, වෙළඳපොල බලවේග මගින් නොව රජය මගින් හසුරුවනු ලැබේ. කවර භාණ්ඩ හා සේවා නිපදවිය යුතුද, ඒවා සඳහා කවර මිලගණන් අයකල යුතුද, ඒවා කෙසේ බෙදා හැරිය යුතුද යනාදී කරුණු පිළිබඳ තීරණයක් ගනු ලබනුයේ රාජ්‍ය සැලසුම් කරුවන් වෙතිනි. එනම් මධ්‍යගත සැලසුම්කරණයක් මගිනි.

(iii) ආර්ථික තීරණ සම්බන්ධයෙන් වන කල්හි සමහර තීරණ, ඉල්ලුම සහ සැපයුම යන නිදහස් වෙළඳපොල බලවේග මගින්ද සමහර තීරණ, රජය මගින්ද ගනු ලැබේ.

(ලකුණු 03)

(ආ) (I) ශ්‍රී ලංකාව මිශ්‍ර ආර්ථික ක්‍රමයක් ලෙස වර්ගීකරණය කෙරේ.

(II) මිශ්‍ර ආර්ථික ක්‍රමයක, රජය සහ පෞද්ගලික අංශය ඒකාබද්ධව ආර්ථිකය හසුරවයි පාලනය කරයි. ඒ අනුව මිශ්‍ර ආර්ථික ක්‍රමයකින් ලැබෙන වාසි වනුයේ;

(i) <u>ප්‍රමාණවත් තරඟකාරීත්වයක් සැලසේ</u>.

පෞද්ගලික ව්‍යවසායකත්වය පැවතීම මගින් වෙළඳපොලෙහි ප්‍රමාණවත් සහ යහපත් කරඟ කාරීත්වයක් ඇතිවීම තහවුරු වන අතර නිෂ්පාදනය කරන භාණ්ඩයන් හි සහ සේවාවන්හි ගුණාත්මක බව පිළිබඳවද සැහීමට පත්විය හැකි තත්ත්වයක් උදාකෙරේ.

(ii) <u>වෙළඳපොල මිලගණන්, මනාලෙස හැසිරවීමකට ලක්වේ.(well regulated)</u>

රජය, සිය මෙහෙයවුම් ආයතනයන්හි ක්‍රියාකාරීත්වය මගින්, වෙළඳපොල මිලගණන්, අදාල පිරිවැය ඉක්මවා නොයන බවට සැහීමකට පත්වේ.

NOT FOR SALE

(iii) ජාතික සම්පත් ප්‍රශස්ත ලෙස භාවිතයට ගැනේ.

රජය සහ පෞද්ගලික යන අංශ දෙක මගින්ම ජාතික සම්පත් උපයෝජනයට ගනු ලබන හෙයින්, මිශ්‍ර ආර්ථික ක්‍රමයක, ජාතික සම්පත් කාර්යක්ෂම ලෙස භාවිතයට ගැනේ.

(iv) ජනතාව වෙත වැඩි නිදහසක් ලැබේ.

භාණ්ඩ හා සේවාවන්හි මිල ගණන්, ගුණාත්මක බව යනාදී කරුණු සම්බන්ධයෙන් සාමාන්‍ය ජනතාව වෙත වඩා ඉහල මට්ටමක හිමිකමක් පවතී.

(v) මෙම ක්‍රමය යටතේ ඒකාධිකාර තත්වයකට ඉඩ ප්‍රස්ථා නොසැලසේ.

රජය සහ පෞද්ගලික ව්‍යවසායකයන් යන දෙඅංශය, සෑම ආකාරයකම සහ සෑම අංශයකම වන ආර්ථික ක්‍රියාකාරකම් වලට ප්‍රවේශවන හෙයන් මිශ්‍ර ආර්ථික ක්‍රමයකදී, ඒකාධිකාර තත්වයක් ඇතිවීමේ ඉඩ ප්‍රස්ථා වැසීයයි.

(ලකුණු 03)

(ඇ) (i) ප්‍රතිමාන (අභිමතානුරූපී) ආර්ථික විද්‍යාව (Normative Economics)

අභිමතානුරූපී තත්වයන් අන්තර්ගත වන, අන්තර්ගත වන, ආර්ථික විද්‍යාව විශ්ලේෂණය කිරීමේ තත්වයකි. මෙහිදී, "සැබවින්ම පවත්නේ කවර ආකාරයෙ තත්වයකදී යන්නට වඩා "පැවතිය යුත්තේ කවර තත්වයක්ද" යන්නට වැඩි අවධානයක් යොමු කෙරේ. ප්‍රතිමාන ආර්ථික විද්‍යාවේදී, පවත්නා තත්වයන්ට අනුරූපීව සිදුකරන "අභිමතානුසාරී" නිගමනයන්ට වැඩි ප්‍රමුකත්වයක් ලැබේ. උදා : රජය විසින් උද්ධමනය පාලනය කරනු ලැබිය යුතුව.

(ii) වාස්ථවික ආර්ථික විද්‍යාව (Positive Economics)

වාස්ථවික ආර්ථික විද්‍යාව යනු ඉහතින් සදහන් ප්‍රතිමාන ආර්ථික විද්‍යාවේ ප්‍රතිවිරුද්ධ තත්වයයි. වාසථවික ප්‍රකාශ, තථ්‍ය කරුණු අන්තර්ගත ප්‍රකාශයන්වේ. මෙහිදී අධ්‍යයනය කෙරෙන්නේ, "කුමක්ද", "කවරක් වීද", " කවරක් වියහැකිද " (i.e. " what is ","what was", "what will be") යන දැක්මකිනි. උදා : මෙම වර්ෂයේ සාමාන්‍ය උද්ධමන අනුපාතිකය 8% කි එනම් පවතින ප්‍රකාශ කිරීමයි. (ලකුණු 03)

(ඇ) දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් , ජාතික ඉතිරි කිරීම, 2010 වර්ෂයේ පැවති 25.4% මට්ටමේ සිට 2011 දී එය 22.1% දක්වා පහත වැටීම, ආර්ථික සංවර්ධනයට ඇතිකරනු ලබන බලපෑම.

(i) ප්‍රාග්ධන සම්පාදනය / අයෝජනය සදහා වන සම්පත් ප්‍රමාණය අඩුවීම.
(ii) ආර්ථිකයේ තථ්‍ය ආයෝජන මට්ටම පහත වැටිය හැකිවීම.
(iii) එහි ප්‍රතිඵලයක් වශයෙන් , ආර්ථික වර්ධන අනුපාතිකය, අපේක්ෂිත තත්වයට වඩා පහත එකක් විය හැකිවීම.
(iv) ආර්ථිකයේ ඌන සම්පත් උපයෝජනයක් පැවතිය හැකිවීම.
(v) ආර්ථික සංවර්ධනය මන්දගාමී විය හැකිවීම.

(ලකුණු 03)
(මුළු ලකුණු 12)

NOT FOR SALE

**පිළිතුරු අංක 02**

(අ)

$$Q(d) = 600 - 15p$$
$$Q(s) = -275 + 20p$$

(I) වෙළඳපොල සමතුලිතතා ලක්ෂයට අදාල මිල සහ ප්‍රමාණය එනම්, $Q_d = Q_s$ වන අවස්ථාවේදී P හි අගය සහ Q හි අගය.

එනම් :

$$600 - 15P = -275 + 20P$$
$$600 + 275 = 20P + 15P$$
$$875 = 35P$$
$$P\ (\text{මිල}) = \underline{\text{රු. } 25}\ (875 / 35)$$

Q හි අගය තීරණය කිරීම සදහා සමීකරණයට, P හි අගය ආදේශ කිරීම:

ප්‍රමාණය Q = 600 - 15 P = 600 - 15 (25) = <u>225 (ඒකක)</u>

(ලකුණු 01)


(II) ඒකකයක මිල = රු. 20/- සහ රු. 30/- යටතේ ඉල්ලුම් කරනු ලබන සහ සැපයුම් කරනු ලබන ප්‍රමාණ දැක්වෙන උපලේඛණය.

(ලකුණු 03)

| මිල ( P) රු. | ඉල්ලුම් කරන ප්‍රමාණය (Q) | සැපයුම් කරන ප්‍රමාණය (Q) |
|---|---|---|
| 20.00 | 300 | 125 |
| 30.00 | 150 | 325 |

(III) වෙළද පොල ඉල්ලුම් සහ සැපයුම් වක්‍ර :

(IV)




(ලකුණු 02)

NOT FOR SALE

<u>අලෙවිකරනු ලබන සෑම ඒකකයක්ම සඳහාම රු. 5 බැගින් වන සහනාධාරයක් දීම මත නව සමතුලිත මිල සහ ප්‍රමාණය ගණනය කිරීම.</u>

Q (d) = 600 - 15P (වෙනසක් නැත)

Q (s) = -275 + 20P (සහනාධාරයට පෙර සැපයුම් සමීකරණය)

Q $(s_1)$ = -175 + 20P (ඒකකයකට රු. 5 වන සහනාධාරයට පසු සැපයුම් සමීකරණය)

<u>නව සමතුලිත මිල .</u>

$$600 - 15P = -175 + 20P$$
$$600 + 175 = 15P + 20P$$
$$775 = 35P$$
$$P = \underline{රු.\ 22.14}\ (ආසන්න වශයෙන්)$$

<u>නව සමතුලිත ප්‍රමාණය .</u> Q = 600 - 15P = 600 - 15 (22.14) = 600 - 332 = <u>268 (ඒකක</u>)

| | | |
|---|---|---|
| නව සමතුලිත මිල | = | රු. 22.14 |
| නව සමතුලිත ප්‍රමාණය | = | 268 (ඒකක) |

(අ) පාරිභෝගික අතිරික්තය = $^1/_2$ (268) (40.00 - 22.14)
= <u>රු. 2,393,24</u>

(ආ) නිෂ්පාදන අතිරික්තය = $^1/_2$ (268) (22.14 - 8.75) + සහනාධාරය
= (1,794.26) + (5.00 x268)
= <u>රු. 3,134.26</u>

(ලකුණු 03)

සටහන (i) රු.40.00 = ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය ශුන්‍ය අගය ගන්වන මිල.

(ii) රු. 8.75 = සහනාධාරයට පසු, සැපයුම් කරනු ලබන ප්‍රමාණය ශුන්‍ය අගය ගන්වන මිල

(iii) ඉහත පරිදි "$^1/_2$" යොදාගන්නේ , ප්‍රස්ථාරයෙන් දැක්වෙන පරිදි වන ත්‍රිකෝණයේ වර්ගඵලය සොයා ගැනීමේ පදනමිනි.

(ආ) භාණ්ඩයක මිල පහත වැටෙන අවස්ථාවකදී, එනම් නිදසුනක් ලෙස ගත්විට, ඒකකයක මිල රු. 10/- සිට රු. 8/- ට අඩුවීමේදී, නව මිල රු. 8/- දී ඉල්ලුම්කරනු ලබන ප්‍රමාණය ඒකක 12 ලෙස සැලකිල්ලට ගතහොත්, එම ඒකක 12කි ප්‍රමාණය, එම භාණ්ඩයේ ඒකකයක මිල රු. 10/- දී ඉල්ලුම්කල ප්‍රමාණයට වඩා බෙහෙවින් වැඩිවිය හැකිය. සාමාන්‍ය වෙළඳපල තත්වය මෙයයි. ඒ අනුව, එහි මිල රු. 10/- දී ඉල්ලුම් කල ප්‍රමාණය ඒකක 8 ක් ලෙස සලකා ගනිමු. ඒ අනුව මිල රු. 10/- සිට රු. 8/- ට අඩුවීමේදී ඉල්ලුම් කරන ලද ප්‍රමාණය, ඒකක 8 සිට ඒකක 12 දක්වා වැඩි වූ බවක් ප්‍රකාශ වේ.

ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය ඒ අයුරින්, ඒකක 4 කින් වැඩවීම (එනම් = 12 - 8 ) සිදුවන්නේ , ප්‍රතික්‍රියා දෙකකන් සිදුවන බලපෑම් හේතුවෙනි. එම ප්‍රතික්‍රියා දෙක වනුයේ :

(i) ආදායම් ප්‍රතික්‍රියාව නැතහොත් "ආදායම් ප්‍රතිවිපාකය"

(ii) ආදේශන ප්‍රතික්‍රියාව නැතහොත් "ආදේශන ප්‍රතිවිපාකය"

NOT FOR SALE

(i) <u>ආදායම් ප්‍රතිවිපාකය (Income Effect)</u>

භාණ්ඩයේ මිල අඩුවීම හේතුකොටගෙන ප්‍රථමයෙන්ම සිදු වන්නේ පාරිභෝගිකයාගේ මූර්ත ආදායම (Real Income) වැඩිවීමයි. එනම්, නිදසුනට අදාලව, පාරිභෝගිකයෙකුගේ දිනක මුදල් ආදායම රු. 200/- ලෙස ගතහොත් , රු. 10/- මිලේදී ඔහුට ගත හැකිව තිබූ මුළු භාණ්ඩ ප්‍රමාණය ඒකක 20 ක් වුවත් රු. 8/- දී ගත හැකි ප්‍රමාණය ඒකක 25 දක්වා වැඩිවීමයි. එම වැඩිවීමේ ප්‍රතිශතය 25 % කි. ( $5 \div 20 \times 100$). මෙය මූර්ත ආදායමේ වැඩවීමකි. නැතහොත් මිලදීගැනිමේ හැකියාව / ක්‍රයශක්තිය වැඩිවීමකි. ඒ අනුව සිදුවන්නේ , මිල අඩුවීම සමඟ එම භාණ්ඩයෙන් ඉල්ලුම්කරනු ලබන වැඩිකිරීමට පාරිභෝගිකයා නැඹුරුවීමයි. එම නැඹුරුවට හෙතුව, මූර්ත ආදායම වැඩිවීම හෙයින් ඒ අනුව සිදුවන, ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය වැඩිවීම, " ආදායම් ප්‍රතිවිපාකය" හේතුවෙන් සිදුවන්නක් ලෙස සැලකේ.

(ii) <u>ආදේශන ප්‍රතිවිපාකය (Substitution Effect)</u>

දෙවනුව සිදුවන්නේ, සලකා බලන භාණ්ඩයේ මිල අඩුවීම නිසා, වෙළඳපොලේ පවතින මෙම භාණ්ඩයට ආදේශක වශයෙන් සැලකෙන අනිකුත් භාණ්ඩවල මිල ගණන්වලට සාපේක්ෂව, අප සලකා බලන භාණ්ඩය වඩාත් ලාභදායී / මිල අඩු (Cheaper) එකක් වීමයි. ඒ අනුව සිදුවන්නේ, ප්‍රථමයෙන්, වෙනත් ආදේශක භාණ්ඩ වලින් මිලදී ගත් ප්‍රමාණයන් අඩුකර, ඒ වෙනුවට දැනට සාපේක්ෂව ලාභදායි වන, මෙම භාණ්ඩයෙන් වැඩිපුර ඒකක ප්‍රමාණයක් මිලදීගැනීමට ඔහු පෙළඹීමයි. මේ අනුව සිදුවන, සලකාබලන භාණ්ඩයෙන් ඉල්ලුම්කරනු ලබන ඒකක ප්‍රමාණය වැඩවීම, සැබැවින්ම, වෙනත් ආදේශක වෙතින් සලකා බලන භාණ්ඩයට ආදේශණය වීමක් මත සිදුවනනක් හෙයින් එම වැඩිවීම "ආදේශන ප්‍රතිවිපාකය" හේතුවෙන් සිදුවන්නක් ලෙස සැලකේ.

(ලකුණු 03)

(ඇ) <u>ගණකාධිකරණ ලාභය සහ ආර්ථික ලාභය</u>

ව්‍යාපාරමය ක්‍රියාකාරිත්වයකින් ලැබෙන අතිරික්තය (Residual) , ලාභය ලෙස නිර්වචනය කලහැකිය. එහෙත් ගණකාධකාරිවරයෙකු සහ ආර්ථික විද්‍යාඥයෙකු මෙම ලාභය ගණනය කිරීමට යොදා ගන්නා ක්‍රමවේදය එකිනෙකට වෙනස්ය.

ආර්ථික විද්‍යාඥයා, "ලාභය " නැතහොත් අතිරික්තය ලෙස සලකන්නේ, ලබාගත් මුළු අයභාරයෙන්, ඉඩම්, ශ්‍රමය, අමුද්‍රව්‍ය සහ ප්‍රාග්ධනය යනාදි නිශ්පාදිදන සාධක සඳහා වන " ආවස්ථික පිරිවැය " අඩුකිරීමෙන් පසු ලැබෙන අතිරික්තයයි. මෙම අතිරික්තයේ ප්‍රමාණය, නැතහොත් ආර්ථික ලාභය, ආයතනයක් තවදුරටත් වෙළඳපොලේ/ කර්මාන්තයේ රැඳී සිටිනවාද නැද්ද යන්න තීරණය කිරීමට බලපාන දිරි දීමනාව ලෙස ඔහු සලකයි. ඒ අනුව :

**ආර්ථික ලාභය = ( අයභාරය - අදාල මුළු ආවස්ථික පිරිවැය )**

ගණකාධිකරණමය අර්ථයෙන් ගත්විට "ලාභය " (බදුවලට පෙර) යනු අයභාරයෙන්, අදාල සියළුම මුදල් පිරිවැය අගයන්, එනම්, වැටුප්, බදුකුලි , ඉන්ධන අමුද්‍රව්‍ය, ණයපොලී සහ ක්ෂයවීම්, අඩුකිරීමෙන් පසු ලැබෙන අතිරික්තයයි.

තවත් ″ ගණකාධිකරණ ලාභය ″ පිළිබඳ නිර්වචනයක් වනුයේ, මුළු අයභාරයෙන් , විකුණන ලද සියළුම භාණ්ඩවලට අදාල පිරිවැය අඩුකිරීමෙන් පසු ලැබෙන අතිරික්තය, ″ලාභය ″ වන බවයි.

ගණනය කිරීමේදී, උපයන ලද අයභාරයෙන් අදාල සියළුම ආවස්ථික පිරිවැය අඩුකිරීමෙන් පසු ලැබෙන අතිරික්තය ආර්ථික ලාභය ලෙස ගැනීමේදී, අවස්ථික පිරිවැය ලෙස සලකනුයේ යොදාගත් සියලුම යෙදවුම් වෙනුවෙන්, එම යෙදවුම සලකා බලන ක්‍රියාකාරීත්වයට යොදාගැනීම නිසා, වෙනත් මාර්ගයකින් නිම යෙදවුම් සඳහා ලබාගැනීමට නොහැකිවූ ප්‍රතිලාභ වන එකතුවයි.

ඒ අනුව, ගණකාධිකරණ ලාභයක් තිබියදීත්, ආර්ථික ලාභයක් නොමැති තත්වයන් අත්දැකිය හැකිය. නිදසුනක් ලෙස ගත්විට, යම් අයෙකු රු. 100,000/- ක් වැයකර ව්‍යාපාරික කටයුත්තක් ගෙනයාමේදී ලබාගත් මුළු අයභාරය රු. 120,000/- කි. එහෙත් එම කාලය තුළදීම ඔහුට වෙනත් කටයුත්තකින් රු. 45,000/- ක් උපයාගත හැකිව තිබුනේ නම්, ඔහු ලබන්නේ ආර්ථික පාඩුවකි. එම ආර්ථික පාඩුවෙ ප්‍රමාණය රු. 25,000/- කි. රු. (25,000) = (120,000 - 100,000) - (45,000).

(ලකුණු 02)
(මුළු ලකුණු 12)

<u>පිළිතුරු අංක 03</u>

(අ) අභ්‍යන්තර මිල ස්ථායිතාවය යනු පොදු මිල මට්ටමේ විශාල වශයෙන් සිදුවන උච්ඡාවචනය වීමක් නොමැති වීමේ තත්වයයි. මෙම ස්ථායිතාවය, තිරසාර ආර්ථික වර්ධනයක් ලගාකර ගැනීමට උපකාරී වේ.

මිල ගණන්හි උච්ඡාවචනය වීම පහල මට්ටමකින් සිදුවීම, ආර්ථිකය තුල ක්‍රියාකාරවන්නන්ගේ ආර්ථික තීරණ ගැනීමේ ක්‍රියාවලියට එතරම් බලපෑමක් ඇති නොකරයි. එම නිසා, ආර්ථික ස්ථායිතාවයට මග පෙන්වන, කාර්යක්ෂම සම්පත් බෙදියාමක් සිදුවීමට බලපාන, කුමක් නිපදවිය යුතුද, කෙසේ නිපදවිය යුතුද, යනාදිය සම්බන්ධයෙන් ගනු ලබන තීරණ වල විකෘති වීමක්, ස්ථායි මිල ගණන් පැවතීම හේතුවෙන් සිදු නොවේ.

ඒ අයුරින්ම ″ බාහිර ස්ථායිතාවය ″ යනු විදේශ විනිමය අනුපාතිකයේ විශාල වශයෙන් සිදුවන උච්ඡාවචනය වීමක් නොමැති තත්ත්වයයි. එම ස්ථායිතත්වය,තිරසාර සහ හිතකර විදේශ වෙළඳ සහ ගෙවුම් ශේෂ තතවයක් පවත්වා ගැනීමට උපකාර වේ.

එම නිසා, අභ්‍යන්තර සහ බාහිර ස්ථායිතාවය ආර්ථිකයක, තිරසාර ආර්ථික සංවර්ධනයක් පවත්වාගෙන යාමට බෙහෙවින්ම අවශ්‍ය වන, තීරණාත්මකව වැදගත් අවශ්‍යතාවයකි.

(ලකුණු 03)

(ආ) මහ බැංකවේ ප්‍රධාන මූල්‍ය ප්‍රතිපත්ති උපකරණ දෙක.

(i) ප්‍රතිපත්තිමය පොලී ප්‍රමාණ සහ විවෘත වෙළඳපොල ක්‍රියාකාරකම්
(ii) වානිජ බැංකු වල තැන්පතු ප්‍රමාණය මත තීරණය කරන ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාවය.

(ලකුණු 02)

(ඇ) (i) <u>ප්‍රතිපත්තිමය පොලී ප්‍රමාණ සහ විවෘත වෙළඳපොල ක්‍රියාකාරකම්</u>

මෙම උපකරණයේ මූලිකාංග වනුයේ (i) මහ බැංකවේ ප්‍රධාන මූල්‍ය ප්‍රතිපත්තිමය පොලී ප්‍රමාණ, එනම්, ප්‍රති-මිලදී ගැනීම් සඳහා වන පොලි අනුපාතිකය (Re- purchase rate) සහ ප්‍රති-මිලදී ගැනීම් ආපසු ලබා දීමට අදාල පොලිය අනුපාතිකය (Reverse re- purchase rate) යොදා ගනිමින් පොළී ප්‍රමාණ කවුළුවක් (an interest rate corridor) නිර්මානය කර තිබීම සහ (ii) දෛනිකව පවත්වාගෙන යන වෙන්දෙසි මගින් ආර්ථිකය තුලට ද්‍රවශීලතාවය ඇතුල්කිරීම හෝ ආර්ථිකයේ ඉහල ද්‍රවශීලතාවය උරාගැනීම සිදුකිරීමය.

මෙම ප්‍රධාන ප්‍රතිපත්ති උපකරණ මගින්, මුදල් වෙළඳපොලේ දෛනික පොලී අනුපාතික (Oversight inter rates) සඳහා ක්‍රියාත්මක වන ඉහළ සහ පහළ සීමාවන් (lower and upper bounds) ඇති කරයි.

දෛනික වෙන්දෙසි / විවෘත වෙළඳපොල ක්‍රියාකාරකම් සිදුකරනුයේ එසේ සිදුකරන සංකෝචනාත්මක ගණුදෙනු මගින් ආර්තිකයේ පවත්නා අධි ද්‍රවශීලතාවයක් වෙතොත්, එම අය ද්‍රවශීලතාවය උරාගැනීමත් (absorb), ද්‍රවශීලතාවය ආර්ථිකය තුලට ඇතුලත් කිරීම අවශ්‍ය වන අවසථාවන්හිදී ප්‍රසාරනාත්මක ගනුදෙනු සිදු කිරීමක් මගින් දෛනික පොලී ප්‍රමාණයන්හි ස්ථායිතත්වයක් පවත්වා ගැනීම තුලින් අපේක්ෂිත මුලන් සංචිත මූල්‍ය ඉලක්ක අපේක්ෂිත පරිදි සපුරා ගැනීමයි.

මෙයට අමතරව " මහ බැංක පොලී අනුපාතය "(Bank Rate) නම් වන තවත් ප්‍රතිපත්තිමය පොලී අනුපාතිකයක්ද වේ. එනම්, මහ බැංකුව, වානිජ බැංකුවලට අවසාන ණය දෙන්නා ලෙස, ණය අවශ්‍යය කරන වානිජ බැංකු සඳහා, එවන් ණය සැපයීමේදී අයකරන පොලී ප්‍රමාණයයි.

(ii) <u>වානිජ බැංකු වල තැන්පතු මත තීරණය කරන ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාවය.</u>

ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය යනු වාණිජ බැංකුවල තැන්පතුවල එකතුවේ පදනම මත, ඒවායේ මුළු එකතුවේ ප්‍රතිශතයක් ලෙස ගණන බැලෙන ප්‍රමාණයට සමාන මුදල් ප්‍රමාණයක් , සංචිතයක් වශයෙන් මහ බැංකුවේ තැන්පත් කිරීමේ අවශ්‍යතාවය සඳහා තීරණය කරන ප්‍රතිශත අනුපාතයයි. මෙම ප්‍රතිශතය/අනුපාතය අතීතයේදී මුදල් සැපයුම පාලනය කිරීම සඳහා බෙහෙවින් යොදා ගැනින.

එහෙත්, දෛනිකව සිදුකරන මූල්‍යමය කළමනාකරණ උපකරණයක් ලෙස මෙම අනුපාතිකය යොදාගැනම ක්‍රමයෙන් අඩුකර ඇත. එයට හේතු වන්නේ වෙළඳපල ක්‍රියාකාරකම් පදනම් කරගත් මුල්‍ය ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය නගා සිටුවීමත්, මෙම ප්‍රතිපත්තිය යටතේ, එසේ ලබාගන්නා සංචිත මුදල් ප්‍රමාණය මත අදාල වාණජ බැංකුවලට දැරීමට සිදුවන සැබෑ අරමුදල් පිරිවැය අඩුකරලීමේ අවශ්‍යතාවත් යන (අවශ්‍යතා) දෙකයි.

මුදල් පනතට අනුව, වාණිජ බැංකු විසින්, මහ බැංකුව නියම කරනු ලබන ප්‍රමාණයට අනුරූප සංචිත ප්‍රමාණයක්, මහ බැංකුවේ තැන්පතු කර පවත්වා ගනු ලැබිය යුතුය. දැනට, වාණිජ බැංකුවල ඇති කාලීන තැන්පතු සහඉතුරුම් තැන්පතු වල එකතුවේ පදනම මත මෙම සංචිත අවශ්‍යතාවය තීරණය කෙරේ.

(ලකුණු 03)

(ඇ) (I) <u>සාධක පිරිවැය මිලට දළ දේශීය නිෂ්පාදිතය ගණනය කිරීම.</u>

යම් වර්ෂයක් තුල, රටක දේශ සීමා ඇතුලතදී නිපදවන ලද සියළුම අවසාන භාණ්ඩ හා සේවාවල මුළු වටිනාකම, දළ දේශීය නිෂ්පාදිතය ලෙස ගැනේ.

"සාධක පිරිවැය" නැතහොත් "මූලික මිල" යන්න ජාතික ගිණුමකරණයේදී යොදාගන්නේ, නිෂ්පාදකයන්ට ලැබෙන භාණ්ඩ මිල ගණන් හඳුන්වා දීමටයි.

NOT FOR SALE

ඒ අනුව සාධක පිරිවැයට , දළ දේශීය නිෂ්පාදිතය යනු  ලාභයද ඇතුලත්ව සියළුම අවසාන භාණ්ඩ හා සේවා සඳහා දරණ ලද සමස්ථ නිෂ්පාදන පිරිවැයයි. නැතහොත්, සමස්ථ වැටුප් සහ සේවක ඉපැයුම්, සමස්ථ බදු කුලී, සමස්ථ පොලී සහ සමස්ථ ආයතනික ලාභ වල මුළු එකතුවයි.

වෙනත් අයුරකින් දක්වතොත් , භාණ්ඩ සහ සේවා නිෂ්පාදන ක්‍රියාවලියේදී, නිෂ්පාදන සාධක හතර වෙතින් උපයාගත් සමස්ථ ඉපයීම්වල එකතුවයි.

(II) <u>දළ දේශීය නිෂ්පාදිතය, වෙළඳපොල මිලට ගණනය කිරීම.</u>

වෙළඳපොල මිලට දළ දේශීය නිෂ්පාදිතය යනු, ජාතියක සමස්ථ නිෂ්පාදනයේ නැතහොත් අවසාන දළ දේශීය නිමවුමේ මූල්‍යමය අගයයි. දේශීය නිමවුම යනු දේශ සමා ඇතුලත නිපදවූ යන්නයි. ඒ අනුව දළ දේශීය නිෂ්පාදිතය යනු, වර්ෂයක් ඇතුලත් රටක දේශ සීමා ඇතුලත නිපදවන ලද සියළුම අවසාන භාණ්ඩ හා සේවාවන්ගේ සමස්ථ අගයයි.

එම අගය "වෙළඳපොල මිලට " ගණනය කිරීම සඳහා එකී භාණ්ඩ හා සේවා ප්‍රමාණය, ඒ ඒ භාණ්ඩයට හෝ සේවාවට අදාල වෙළඳපොල මිලගණන් වලින් ගුණකිරීම කළයුතු වේ. මෙහිදී වෙළඳපොල මිල යනු, පාරිභෝගිකයන්, එම භාණ්ඩ සේවා  සඳහා ගෙවන සැබෑ මිලගණන් වේ.

මේ අනුව වෙළෙඳපොල මිලට දළ දේශීය නිෂ්පාදිතය = (දළ දේශීය නිෂ්පාදිතය, සාධක පිරිවැයට) + (භාණ්ඩ බදු නැතහොත් වක්‍ර බදු) - ( නිෂ්පාදිත මත ගෙවන සහනාධාර)

(ලකුණු 04)
(මුළු ලකුණු 12)

<u>පිලිතුරු අංක 04</u>

(අ) <u>උද්ධමනය</u>

"උද්ධමනය" යනු යම් කාලපරිච්ඡේදයක් තුලදී රටක සියළුම භාණ්ඩ හා සේවාවන්හි සාමාන්‍ය මිලගණන් වල ඉහල යාමයි. නැතහොත් එසේ එය භාණ්ඩ හා සේවාවන්හි සාමාන්‍ය මිල මට්ටම් ඉහල යාමේ වේගයයි. (ලකුණු 02)

(ආ) කොළඹ පාරිභෝගකයන්ගේ  මිල දර්ශකය, ශ්‍රී ලංකාවේ උද්ධමන අනුපාතිකය මැන දැක්වීම සඳහා යොදා ගැනේ. (ලකුණු 01)

(ඇ) (i) "ඉල්ලුමෙන් ඇදුනු උද්ධමනය"  යනු  "මුළු ඉල්ලුම" සහ "මුළු සැපයුම" අතර පවත්නා අසමබර තත්ත්වය් හේතුවෙන් ඇතිවන මිල ගණන් ඉහලයාමේ තත්වය විස්තර කිරීම සඳහා කේන්ස්ගේ ආර්ථික න්‍යායයන්හිදී යොදා ගත් පදයයි. ආර්ථිකයක සමස්ථ ඉල්ලුම, සමස්ථ සැපයුම ඉක්මවා  යන විට වෙළඳපොළ මිල ගණන් ඉහළ යාම සැබැවින්ම සිදුවේ. ආර්ථික විද්‍යාඥයන් මෙම තත්වයට හේතුව ලෙස දක්වන්නේ, කඩා භාණ්ඩ ප්‍රමාණයක් පසුපසය. විශාල මුදල් ප්‍රමාණයක් හඹායන තත්වයක් පැවතීමයි.

NOT FOR SALE

(ii ) "පිරිවැයෙන් ඇදුනු උද්ධමනය" යනු , ප්‍රධාන වශයෙන්, නිපදවනු ලබන භාණ්ඩ හා සේවාවන් සඳහා යොදා ගැනෙන අමුද්‍රව්‍ය සහ ශ්‍රමයේ පිරිවැය ගණන් ඉහලයාමේ හේතුවෙන්,අවසාන භාණ්ඩ හා සේවා වනහි පොදු මිල මට්ටම් ඉහලයාම නැතහොත් ඒ අනුව ඇතිවන උද්ධනමනයය.

(ලකුණු 04)

(ඇ) දළ දේශීය නිෂ්පාදන අවධමනකය (GDP Deflator)

දළ දේශීය නිෂ්පාදන අවධමනකය යනු, ජාතික ආදායමේ ගිණුම්කරණයේදී , නාමික අගයට නැතහොත් පවත්නා මිල ගණන් යටතේ ගණනය කරන වටිනාකමට අදාල මූර්ත වටිනාකම (එනම් පරිමාව) අතර පවතින අනුපාතයයි.

$$\text{දළ දේශීය නිෂ්පාදන අවධමනකය} = \frac{\text{නාමික අගයට (GDP)}}{\text{මූර්ත GDP}} \times 100$$

(ලකුණු 02)

මෙහිදී "මූර්ත GDP" යනු ස්ථාවර පිරිවැයට ගණනය කල GDP වේ.

මෙම ගණනයෙන් සිදුකරනුයේ, දළ දේශීය නිෂ්පාදිතයේ නාමික නැතහොත් මුදල් වටිනාකම, මූර්ත අගයක් බවට පරිවර්තනය කිරීම මගින් මූර්ත මිනුමක් ලබාගැනීමයි. මෙම මිනුම මගින්, වර්ෂ ගණනාවක් සැලකිල්ලට ගැනීමේදී දළ දේශීය නිෂ්පාදිතයේ මූර්ත / සැබෑ වර්ධනය මැන බැලීම කළහැකිවේ.

(ඉ) (i) "දේශීය සැපයුමේ තත්වයන්හි වර්ධනය" යන්නෙන් මෙහිදී අදහස් කරනුයේ කෘෂිකාර්මික භාණ්ඩ සම්බන්ධයෙන් ගත්විට, පැවති යහපත් කාලගුණික තත්වයන් නිසාත්, තාක්ෂණික දියුණුව සහ උසස් අධ්‍යාපනය ආදී අංශ වලින් ලද ප්‍රගතියක් හේතුවෙන් ආර්ථිකය තුළ සමස්ථ සැපයුම් තත්වය ඉහල යාමයි.

(ii) "විචක්ෂණ ද්‍රවශීලතා කළමනාකරණය" යන්නෙන් අදහස් කරනුයේ ආර්ථිකයතුල පැවති අතිරික්ත මුදල් සැපයුම / අතිරික්ත ද්‍රවශීලතාවය හේතුවෙන් ඇතිවන මුළු ඉල්ලුමේ වර්ධනයේ බලපෑම අවම කරමින් , ආර්ථිකයේ මුළු ඉල්ලුම ප්‍රශස්ත ලෙස "මුළු සැපයුමට " අනුකූල වන පරිදි හැසිරවීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් රටේ මූල්‍ය ප්‍රතිපත්තිය මනාලෙස හසුරුවා ඇති බවයි.

(ලකුණු 03)
(මුළු ලකුණු 12)

<u>පිළිතුරු අංක 05</u>

(අ) ගෙවුම් ශේෂය (BOP)

නිශ්චිත කාලපරිච්ඡේදයක් ඇතුලත, එනම්,සාමාන්‍යයෙන් වර්ෂයක් තුල, යම් රටක්, ලෝකයේ අනිකුත් සියළුම රටවල් සමඟ පවත්වාගෙන යන සියළුම ගණුදෙනුවල අවසාන ප්‍රතිඵල තත්වය පෙන්වන වාර්තාව නැතහොත් ගිණුමයි. මෙමගින් මූල්‍යමය අපනයන සහ ආනයනයද ඇතුලත් සියළුම අපනයන සහ ආනයන්හි ඩොලර් වලින් දක්වන වටිනාකම්හි වෙනස පෙන්වාදෙයි.

NOT FOR SALE

එනම් මුළු අපනයන සහ මුළු ආනයන අතර වෙනස කොපමණද යන්නයි. ඍණ ගෙවුම් ශේෂයක් යනු රටට ගලාඑන ලද ප්‍රමාණයට වඩා වැඩි මුදල් ඩොලර් ප්‍රමාණයක් රටින් පිටතට ගලාගොස් ඇතිබවයි. දිගින් දිගටම පවත්නා ඍණ ගෙවුම් ශේෂ තත්වයක් හේතුවෙන් අහිතකර බාහිර අස්ථායිතාවයක් අත්දැකීමට රටකට සිදුවේ.

(ලකුණු 02)

(ආ) ගෙවුම් ශේෂයේ ප්‍රධාන සංරචක

ගෙවුම් ශේෂ ලේඛනයක ඇතුලත් ප්‍රධාන සංරචක

| |
|---|
| (I) වර්තන ගිණුම |
| (අ) භාණ්ඩ ගිණුම |
| (ආ) සේවා ගිණුම |
| (ඇ) ආදායම් |
| (ඈ) වර්තන පැවරුම් |
| (II) ප්‍රාග්ධන සහ මූල්‍ය ගිණුම |
| (i) ප්‍රාග්ධන ගිණුම |
| (අ) ප්‍රාග්ධන පැවරුම් |
| (ආ) නිෂ් පාදනය නොකරන සහ මූල්‍ය නොවන වත්කම් |
| (ii) මූල්‍ය ගිණුම් |
| (අ) ඍජු ආයෝජන |
| (ආ) ආයෝජන |
| (ඇ) වෙනත් ආයෝජන |
| (ඈ) සංචිත වත්කම් |

(ලකුණු 02)

(ඇ) ගෙවුම් ශේෂ ගැටළුව සඳහා පාදකවූ ප්‍රධාන හේතු

(i) පැවති ලෝක ව්‍යාප්ත ආර්ථික අවපාතය.

(ii) යම් යම් කෘෂිකාර්මික භාණ්ඩ සඳහා පැවති මිල ගණන් ක්‍රමිකව පහත වැටීම. උදා : තේ

(iii) ශ්‍රී ලංකාව මධ්‍යම මට්ටමේ ආදායම උපයන රටක් ලෙස වර්ගිකරණය වීම මත, යම් යම් අපනයන බදු සහන නොලැබී යාම.

(iv) ශ්‍රී ලංකා රුපියල තවදුරටත් අවප්‍රමාණය වේය යන අපේක්ෂා මත, අපනයන කරුවන්ද සිය අපනයන සඳහා ලබාගත් විදේශ ඉපයීම් රට තුලට ප්‍රේෂණය නොකර, විදේශයන්හි රඳවා තැබීම හේතුව මත රට තුලට විදේශ විනිමය ගලා ඒම සිදුනොවීම.

(ලකුණු 03)

(ඈ)

(i) ප්‍රධාන වශයෙන් ඉන්ධන මිළගණන් ඉහල යාම හේතුවෙන් විදේශ විනිමය පිටතට ගලායාමේ වේගය වැඩිවීම.

(ii) මෝටර් රථ ඇතුළු , පාරිභෝගික භාණ්ඩ සඳහා වන ඉල්ලුම ඉහල යාම නිසා ආනයන ඉහල යාම.

(ලකුණු 02)

(ඉ) ගෙන ඇති නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග

NOT FOR SALE

(i) විදේශ ව්‍යවහාර මුදල් වලට එරෙහිව, ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය කිරීම සහ ශ්‍රී ලංකා රුපියල, විදේශ විනිමය වෙළඳපොලේ , පාවීමට ඉඩ හැරීම.

(ii) ආනයන ඉල්ලුම වැඩිවීමට හේතුවන සහ සමස්ථ ඉල්ලුමේ ඉහල යාමට බලපෑම්කෙරෙන, ආර්ථිකය තුළ පැවති අතිරික්ත ද්‍රවශීලතාවය පාලනය කිරීම සඳහා, ප්‍රධාන වශයෙන්, පොලී ප්‍රමාණ ඉහළ නැංවීම ඇතුළු මූල්‍ය ප්‍රතිපත්තිමය පාලනයන් හඳුන්වාදීම.

(iii) මෝටර් රථ වැනි තෝරාගත් භාණ්ඩ ගණනාවක් සඳහා වන ආනයන බදු නැංවීම තුලින් ආනයන සඳහා වන ඉහළ ඉල්ලුම පාලනය කිරීමට පියවර ගැනීම මගින් මුළු ආනයන බිලට සිදුවන ඉහල පීඩනය අවම කිරීමට පියවර ගැනීම.

(iv) ආනයන සඳහා වාණිජ බැංකුවලින් ලබාදෙන ණය පහසුකම් අඩු කිරීම සඳහා වාණිජ බැංකු පෙළඹවීම.

(v) ආනයන කරුවන්ගේ විදේශ විනිමය ඉපයීම් ශ්‍රී ලංකාව තුලට පූර්ණ වශයෙන් ගලා ඒම සහතික කිරීම සඳහා වන පෙළඹවීම් හඳුන්වාදීම.

(ලකුණු 03)
(මුළු ලකුණු 12)

## II කොටස

**පිළිතුරු අංක 06**

(අ) කළමණාකරන ක්‍රියාවලිය.

ආයතනයක් නියමිත අරමුණු සහ ඉලක්ක සපුරා ගැනීම සඳහා, මානව , මූල්‍ය සහ ද්‍රව්‍යමය වශයෙන් වන සම්පත් පරිහරණය සම්බන්ධයෙන් සඳුකරනු ලබන සැලසුම්කරණය, එම සැලසුම් ක්‍රියාත්මකකිරීම සහ එම ක්‍රියාකාරිත්වය පාලනය හා සම්බන්ධ ක්‍රියාවලියයි.

(ලකුණු 03)

(ආ) "පාලනය" ක්‍රියාවලියට පහත සඳහන් පියවර ඇතුලත්ය.

(i) තථ්‍ය කාර්ය සාධන අගයන, සැලසුම්කල කාර්ය සාධන අගයන් සමඟ සැසඳීම.
(ii) එකී සැසඳීම මගින්, ඒ ඒ අගයයන් අතර ඇති වෙනස මැන දැක්වීම.
(iii) එම වෙනස්කම් ඇතිවීමට හේතු සාධක වූ කරුණු , විශ්ලේෂණය කර දැනගැනීම.
(iv) එම හේතුවූ කරුණ සලකා බලා ඒ අනුව එවැනි වෙනස්කම් නැවත ඇති නොවීම හෝ එම තත්වය අවම කරගැනීම සඳහා අවශ්‍ය නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග හඳුන්වා දීම.

මේ අනුව, විධිමත් සැලසුම්කරණයක් සිදු වී ඇත්නම්, පූර්වගාමීය තීරණය කල ඉලක්ක තිබිය නොහැකි හෙයින් පාලනය සඳහා ගත යුතුවන ඉහත සඳහන් (i) සහ (ii) පියවරයන් ගත නොහැකිවේ තත්වය එසේ වන්නේ නම් ඉහත (iii) පියවරද ගත නොහැකිය. එම නිසා "පාලනය" ට අදාල ප්‍රධාන අරමුණ වන නිවැරදි කිරීමේ ක්‍රියාවලියකට ප්‍රවේශවීමේ හැකියාව අහිමි වේ. නැතහොත් පාලනයක් ක්‍රියාත්මක නොවේ.

(ලකුණු 03)

(ඇ) " බලතල පැවරීම " යනු බලය සතු පුද්ගලයා හෝ අධිකාරය විසින්, එකී බලතල සහ ඊට අදාල වගකීම්, පාලන ව්‍යුහයේ වෙනත් පාර්ශවයකට, සාමාන්‍යයෙන් කළමනාකරුවකුට හෝ යටත් නිලධාරියෙකුට, පවරනු ලැබීමයි. කෙසේවුවත්, මෙසේ බලය පැවරීම හේතුවෙන් බලය පැවරූ පුද්ගලයාට අදාල වගකීමෙහි කිසිදු වෙනසක් සිදු නොවේ. බලතල පැවරීම මගින්, බලතල පැවරීම ලබන්නාට, අදාල තීරණ ගැනීමේ බලය හිමිවේ. ඒ අනුව මෙහිදී සිදුවන්නේ සංවිධාන ව්‍යුහය තුල, ඉහළ මට්ටමකට අදාලව පැවති අදාල තීරණ ගැනීමේ බලතල, පහල මට්ටමක සිටින පාර්ශවයක් වෙත විතැන්වීමයි.

(ලකුණු 02)

(ඈ) සාර්ථක බලය පැවරීමක් සිදුවීමට, සම්පූර්ණ විය යුතු පූර්ව අවශ්‍යතා.

(i) බලතල පැවරීම හා සම්බන්ධ "කාර්යය" (Task), ප්‍රථමයෙන්ම නිවැරදිව හඳුනාගැනීම.

(ii) බලය පැවරීම සිදුකිරීම සඳහා සුදුසු දක්ෂතා ඇති නිවැරදි පුද්ගලයා නිවැරදිව හඳුනාගැනීම.

(iii) පවරන ලද කාර්යය කරගෙන යාම සඳහා බලතල ලබන තැනැත්තාට, අවශ්‍ය පුහුණුව ලබාදීම.

(iv) නියමිත කාර්යය ඉටුකිරීමට ප්‍රමාණවත් බලතල ලබාදීම සහ අවශ්‍ය සම්පත් ලැබෙන්නට සැලැස්වීම.

(v) අවශ්‍ය අවස්ථාවන්හිදී මඟ පෙන්වීම් සහ අවශ්‍ය උපදෙස් ලබාදීම පිණිස, බලතල පවරන්නා නැතහොත් ඉහළ නිලධාරියාගේ සූදානමක් තිබීම.

(vi) ලබාගන්නා වාර්තා මගින්, බලය පවරන්නා , බලය පැවරීම ලද නිලධාරියාගේ කාර්ය සාධන ප්‍රගතිය නිරන්තර ඇගයීමක ලක්කිරීම.එහෙත්, බලය ලද පුද්ගලායා දැඩි පාලනයකට ලක් කිරීම සිදුනොකල යුතුය.

(vii) පවරන ලද කාර්යය සාර්ථකව නිම කිරීම මත, බලය පැවරීම ලද යටත් නිලධාරියාට, ප්‍රමාණවත් ප්‍රතිලාභ (Rewards) ලබාදීම.

(ලකුණු 04)
(මුළු ලකුණු 12)

<u>පිළිතුරු අංක 07</u>

(අ) <u>සඵල සන්නිවේදනය</u>

පුද්ගලයන් අතර, කථනය, ලිවීම හෝ හැසිරීම් ස්වභාවයන් (Body Language) මගින්, තොරතුරු හුවමාරු කර ගැනීම, සන්නිවේදනය නම් වේ. සඵල සන්නිවේදනය යනු මෙසේ තොරතුරු හුවමාරු කරගැනීම පිළිබඳ ක්‍රියාකාරීත්වය වඩාත් සඵලවත් ක්‍රියාවලියක් දක්වා දීර්ඝවීමයි. එනම්, සංනිවේදනය කරන්නාගේ " සන්නිවේදනයේ " අන්තර්ගතය, අපේක්ෂිත අයුරින් සහ නිවැරදිව, සංනිවේදනය ලබන්නා අවබෝධකර ගැනීමයි. සඵල සන්නිවේදනයේ අරමුණ වන්නේ, අදාල විෂය කරුණ සම්බන්ධනයෙන් පොදු දැක්මක් ඇතිකර ගැනීම, අවශ්‍ය පරිදි චර්යා වෙනස්කම් සිදුකිරීම සහ අවශ්‍ය තොරතුරු ලබාදීමයි.

(ලකුණු 03)

(ආ) <u>කළමනාකරුවන්ට, සඵලවත් සංනිවේදනයක් තිබීම අවශ්‍ය වන්නේ :</u>

මෙමගින් කළමනාකරණ පරිසරය පිළිබඳ නිවැරදි අවබෝධයක් කළමනාකරුවන් සහ සේවකයන් අතර ගොඩනැගේ. එය සෘජුවම, සේවක ඵලදායිතාවය නැංවීමට හේතුකාරක වේ.

එම නිසා, කළමනාකරු ප්‍රකාශ කරනුයේ කවරක්ද යන්න අනෙකුත් පාර්ශවයන්ට නිවැරදිව අවබෝධවනු පිණිස, නිවැරදි සහ පැහැදිලි කථනය ඉතා වැදගත්ය. එය නිවැරදි තොරතුරු සහ නිවැරදි නිගමන වලින් යුක්ත විය යුතු අතර, අගතිගාමී පක්ෂපාති නොවන (Not biased) කරුණු දැක්වීමක් වියයුතුය. එය සරලවූ සහ විධිමත් එකක් විය යතුය. ඒ අනුව එමගින්, සේවකයන්ට යම් මගපෙන්වීමක් (same direction) සිදුවන්නක් විය යුතුය.

(ලකුණු 03)

(ඇ) සෑම මානවයෙක්ම, තමා පිළිගැනීමකට ලක්වීමකටත් ඇගයීමකට ලක්වීමටත්, ගරුත්වයකට භාජනය වීමටත් කැමැත්තේය. පිළිගැනීමකට ලක්වීමට ඇති කැමැත්ත (Esteem Needs) ඔවුන්ගේ පොදු අවශ්‍යතායකි. ඒ අනුව ඔවුහු එවැනි තත්වයකට පත්වීමේ අටියෙන් ( to gain a recongnition) නිතරම කටයුතු කරත්. ඔවුහු අනුනගේ ගෞරවාදරයට ලක්වීමට කැමැත්තෝය.

මාස්ලෝ විසින් , මෙම, පුද්ගලයා වෙත ඇති පිළිගැනීමට ඇති කැමැත්ත පිළිබඳ අවශ්‍යතාවයන්, "පහල"සහ"ඉහල" යනුවෙන් දෙආකාරයකින් දක්වන්නට යෙදින. "පහල" තත්වය යනු අනුනගේ ගෞරවාදරයට ලක්වීම, පිළිගැනීම, ප්‍රසිද්ධිය, අවධානයට යොමුවීම ආදී අංශවලින් ඇති අවශ්‍යතාවයයි. "ඉහල" තත්වය යනු ශක්තිමත් බවක් ලබාගැනීම, දක්ෂතා ඇති කරගැනීම, ස්වයං විශ්වාසයක් ගොඩනගා ගැනීම, ස්වාධීනත්වයක් සහ නිදහසක් අත්කරගැනීම යන අංශවලින් ඇති අවශ්‍යතාවයයි. මෙම තත්වයන්ගෙන් බැහැරවීම, හීනමානයක් ඇතිවීමටත්, උදාසීන වීමටත් හේතුවිය හැකිය. එම නිසා, සේවක අභිප්‍රේරණය සඳහා මෙම මූලික අවශ්‍යතා හඳුනාගෙන කටයුතු කිරීම අතිශය වැදගත්ය.

(ලකුණු 03)

(ඇ) ස්වස්ථිතාව හෝ නඩත්තු සාධක (Hygieme or Maintenance Factors)

සේවකයන්, සිය කාර්යයන් ඉටුකරන පරිසරය පිළිබඳ සාධක මේ ගනයට අයත්වේ. එම සාධක සම්බන්ධයෙන් , පවතින අයහපත් වතාවරණය, අතෘප්තිමත් බවක ඇතිවීමට හේතුවේ. කෙසේවුවත්, අභිප්‍රේරණ සාධකවල පැවැත්ම මෙන්, මෙම සාධකවල ප්‍රශස්ත පැවැත්ම, අවශ්‍යයෙන්ම රැකියා තෘප්තියක් ඇති වීමට හේතු නොවේ. ඒ අනුව මෙම සාධක වෙතින්, සිදුවන බලපෑම වනුයේ ඇතිවන රැකියා තෘප්තිය වඩාත් වැඩි දියුණු වීමට හේතු කාරක වීමයි. මෙම සාධක වලට අදාල වන නිදසුනක් වනුයේ

(i) ආයතන ප්‍රතිපත්ති
(ii) වැඩපල තත්වයන්
(iii) වැටුප
(iv) ප්‍රතිලාභ
(v) අධීක්ෂණය

(ලකුණු 03)
(මුළු ලකුණු 12)

NOT FOR SALE

# නිවේදනය

මෙහි ලබාදුන් පිළතුරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මගින් (ශ්‍රී ලංකා ව.ග.) පමණක් ලබාදෙන ලද අතර, එම පිළිතුරු ඔබ විසින් එය "එසේම" යන පදනම මත පිළිගත යුතු වේ.

එම පිළිතුරු "ආදර්ශ පිළිතුරු" ලෙස අදහස් නොකරන නමුත් ඒවා බොහෝදුරට suggested solution ලෙස දැක්වේ.

පිළිතුරු වලින් පධාන අරමුණු දෙකක් ඉටුකෙරේ. ඒවා නම්,

01. විභාග ප්‍රශ්නයකට යෝජිත විසඳුමක් සඳහා සවිස්තරාත්මක නිදසුනක් (උදාහරණයක්) සැපයීම සහ,

02. ශිෂ්‍යයන්ට විෂය පිළිබඳව තොරතුරු පර්යේෂණය කිරීම සඳහා අත්වැලක් සැපයීම සහ විෂය පිළිබඳව ඔවුන්ගේ අවබෝධය සහ අගය වර්ධනය කිරීම.

මෙම යෝජිත විසඳුම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (ශ්‍රී ලංකා ව.ග.) කිසිදු ප්‍රතිඥාභාරයක් ලබා නොදෙන නිසා ඒ සම්බන්ධව කිසිදු අගතියකට පත්වීමක් පිළිබඳව මැසිවිල්ලක් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට (ශ්‍රී ලංකා ව.ග.) එරෙහිව ඉදිරිපත් කිරීමට ඔබ හට හේතුවක් නොමැත. ඒ කෙසේ වෙතත් ඔබ විසින් යම් නඩුකරයක්, වන්දි ඉල්ලීමක්, පෙත්සමක්, තර්ජනය කිරීමක් හෝ බලවත් ඉල්ලීමක් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට (ශ්‍රී ලංකා ව.ග.) එරෙහිව ගොනුකරනු ලැබ එයින් සැලකියයුතු අන්දමේ ජයග්‍රහණයක් ලබා නොගතහොත් ඔබ විසින් එම නඩුකරයට අදාළ සම්පූර්ණ නෛතික ගාස්තු සහ වියදම් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට (ශ්‍රී ලංකා ව.ග.) ගෙවිය යුතු වේ. එනයින්ම මෙම අයිතිවාසිකම හෝ මෙහි විස්තර කෙරෙන හෝ ශ්‍රී ලංකාවේ නීතීන් යටතේ හිමි වෙනත් අයිතිවාසිකම් බලාත්මක කරවා ගැනීම සඳහා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට (ශ්‍රී ලංකා ව.ග.) නෛතික ක්‍රියාමාර්ගයකට යොමුවීමට සිදුවුවහොත්, ඊට අදාළ නෛතික ගාස්තු සහ වියදම්ද ඔබ විසින් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට (ශ්‍රී ලංකා ව.ග.) ගෙවිය යුතුවේ.

NOT FOR SALE

2 2013 ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (ශ්‍රී ලංකා ව.ග.) මගිනි.
සියළුම හිමිකම් ඇවිරිණි.

**මෙම ලේඛණයේ කිසිම සටහනක් ප්‍රතිඋත්පාදනය කිරීම, කුමන හෝ ආකාරයකින් හෝ ක්‍රමයකින් එනම්, ඉලෙක්ට්‍රොනික, යාන්ත්‍රික, ඡායා පිටපත් කිරීම, වාර්තාගත කිරීම හෝ වෙනත් ක්‍රමයකින් සම්ප්‍රේෂණය කිරීම ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ (ශ්‍රී ලංකා ව.ග.) පූර්ව ලිඛිත අවසරයකින් තොරව සිදු නොකළ යුතුය.**